අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

281

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023

පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................................
    (මුලකුරු සමග නිවැරදි ව ලියන්න)
02. විදුහලේ නම සහ ලිපිනය : ..........................................................................................
03. පාසල් වර්ගය : 200 අඩු / 201-500 තෙක් / 500ට වැඩි
04. කලාපය : ..........................................................................
05. පළාත : ..........................................................................

## ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

9 ශ්‍රේණිය

කාලය පැය 02යි.

I කොටසින් එකක් ද II කොටසේ (අ) යටතේ එකක් ද (ආ) යටතේ එකක් ද (ඉ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

### I කොටස

1. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 250 - 300 අතර රචනයක් ලියන්න.

(අ) අපේ ජන සාහිත්‍යය ඉතා ඈත ඉතිහාසයකට උරුමකම් කියන්නකි. අප මුතුන් මිත්තන්ගේ දිවි පෙවෙත මෙම ජන සාහිත්‍යයෙන් අපූරුවට පිළිබිඹු වේ. ඒ ජන සාහිත්‍යයේ එන සාම්ප්‍රදායික යෙදුම් ආදිය අපේ බස පෝෂණය කරයි. රසවත් කරයි. එමෙන් ම ජන සාහිත්‍යය අපට ජීවිතාවබෝධය ලබා දෙයි.මෙම කරුණු පදනම් කර ගෙන **අපේ ජන සාහිත්‍යය** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ආ) විද්‍යාව හා තාක්ෂණය සමග ලෝකය දිනෙන් දින දියුණු වෙමින් පවතියි . විශේෂයෙන් අප ආශ්වාස කරන වායුව දූෂණයට ලක් වෙමින් පවතියි. එම නිසා බොහෝ තාක්ෂණික උපකරණ අපේ ජීවිතයට එක් වී තිබේ. තාක්ෂණය නොනිසි ලෙස පරිහරණය කිරීමෙන් සිදු වන විවිධ ආපදා ගැන ද අපට නිතර ම අසන්නට ලැබේ. එබැවින් විද්‍යාව හා තාක්ෂණය භාවිතයේ දී සැලකිලිමත් විය යුතු ය. මේ කරුණු පදනම් කර ගෙන " **විද්‍යාව හා තාක්ෂණය සැලකිල්ලෙන් භාවිත කරමු**" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඇ) අවට පරිසරයේ සිදු වන වායු දූෂණය හේතුවෙන් පරිසරයට අනිසි බලපෑම් එල්ල වේ. විශේෂයෙන් අප ආශ්වාස කරන වායුව දූෂණයට ලක් වෙමින් පවතියි. මේ සඳහා මිනිස් ක්‍රියාකාරකම් මෙන් ම ස්වාභාවික ක්‍රියාකාරකම් ද හේතු වේ. මේ කරුණු ඇතුළත් කරමින් **වායු දූෂණය වළක්වා ගනිමු** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඈ) යටත් විජිතවාදීන්ගෙන් නිදහස ලබා ගැනීම සඳහා සාහිත්‍ය නිර්මාණකරුවෝ පෙරමුණ ගත්හ. ඔවුන් අතින් ඒ උදෙසා දේශාභිමානය මුල්කරගත් විවිධ සාහිත්‍ය නිර්මාණ බිහි විය. එම දේශාභිමානී සාහිත්‍ය නිර්මාණ ද ජනයාගේ රට දැය කෙරෙහි ඇති ලැදියාව වර්ධනය කිරීමට ඉවහල් විය. මෙම කරුණු පදනම් කර ගෙන **දෙස බස රැස නැංවූ හෙළ සාහිත්‍යකරුවෝ** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඉ) කෘෂිකාර්මික අර්ථ ක්‍රමයකට උරුමකම් කී ශ්‍රී ලංකාව අතීතයේ ස්වයංපෝෂිත රටක් විය. එදා පෙරදිග ධාන්‍යාගාරය නම් විරුදාවලිය ලැබූව ද අද වන විට එය විජාතික යැපුම් ආර්ථිකයකට තල්ලු වී ඇත. භෞතික හා මානව සම්පත්වලින් අනූන අපේ රට සංවර්ධනය කරා ගමන් කරවීම සඳහා සියලු දෙනා පෙරමුණ ගත යුතු වේ. මේ කරුණු සැලකිල්ලට ගනිමින් **අපේ ම දෑතින් අපේ රට සංවර්ධනය කරමු** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ලකුණු 40 යි.)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!
CamScanner

(2) WWW.PastPapers.WiKi (2)

## II කොටස

(අ) (i) ඔබ පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විවිධ ක්ෂේත්‍රවලින් විශිෂ්ට දක්ෂතා පෙන්වුව ද ඔවුන්ට ක්‍රීඩා අංශයෙන් ඉහළට යෑමට අවස්ථාවක් නොලැබේ. ඊට හේතුව වන්නේ පාසලට ක්‍රීඩා පිටියක් නොමැති වීම යි. පාසලට යාබදව ඇති මුඩු ඉඩම ඒ සඳහා ලබා දෙන ලෙස ඉල්ලමින් පාසල් සංවර්ධන සමිතියේ ලේකම් විසින් පළාත් සභාවේ ක්‍රීඩා ඇමතිවරයා වෙත යවන **ලිපිය** ලියන්න.

(ii) ඔබ පාසලේ සිසුන් බොහෝ දෙනෙකු උදේ ආහාරය නොගෙන පාසලට පැමිණීම නිසා විවිධ අපහසුතාවලට ලක් වන බව නිරීක්ෂණය වී ඇත. රස ගුණ පිරි , පහසුවෙන් සාද, ගත හැකි දේශීය ආහාර පිළිබඳ දැනුම ද අවම බව පෙනේ. දේශීය ආහාර පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ආචාර්යවරයෙකුගේ සහාය ලබා ගැනීමට දෙමවුපිය රැස්වීමේ දී තීරණය විය. පාසල් සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතා ඒ සඳහා දේශකයෙකු ගෙන්වා ගැනීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යායතනයට යැවිය යුතු **ලිපිය** සකස් කරන්න.

(ලකුණු 20 යි.)

(ආ) (i) ඔබේ ගම් ප්‍රදේශයේ ජීවත් වන දෑස් නොපෙනෙන පාසල් ශිෂ්‍යයෙක් පසුගියදා පැවති සමස්ත ලංකා ජන ගායනා තරගයකින් ප්‍රථම ස්ථානය ලැබුවේ ය. ආර්ථික දුෂ්කරතා රැසක් මැද ජීවත් වන ඔහුගේ ජයග්‍රහණය ඇගයීමට පාසලේ උත්සවයක් සංවිධානය කෙරිණි. බොහෝ නිලධාරීන්, සුබ පතන්නන් සහභාගි වූ එම උත්සවය අවසන් වූයේ බොහෝ සංවේදී මිනිසුන්ගේ පරිත්‍යාග මධ්‍යයේ ය. මේ සිදුවීම අළලා **පුවත්පත් වාර්තාවක්** ලියන්න.

(ii) 'කැලිකසළින් තොර සුන්දර ගම්මානයක්' සංකල්පය යටතේ ඔබ ප්‍රදේශයේ පැවැත්වීමට නියමිත කසළ මිල දී ගන්නා පොළ පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට සුදුසු **දැන්වීම් පත්‍රිකාවක්** පිළියෙල කරන්න.

(ලකුණු 20 යි.)

(ඉ) (i) ඔබ පාසලේ වාර්ෂික කලා උළෙලේ සමාරම්භක අවස්ථාවට සහභාගි වන මෙන් දන්වමින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යවන **ආරාධනා පත්‍රය** සකස් කරන්න.

(ii) විවිධ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් අද වන විට ජලය දූෂණය වෙමින් පවතියි. ඔබේ ගම් ප්‍රදේශය මැදින් ගලා යන ඇළ මාර්ගය ද දූෂණයට ලක් වෙමින් පැවතීම නිසා බොහෝ අර්බුදවලට නුදුරු අනාගතයේ දී ම මුහුණ දීමට සිදුවනු ඇත. ඉම් පිළිබඳ වහා ම ක්‍රියාත්මක වීම අවශ්‍ය වේ. ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කිරීම ග්‍රාමසංවර්ධන සමිතියේ ලේකම් ලෙස ඔබට පැවරී ඇත. ඒ අනුව සුදුසු **පෝස්ටරයක්** සකස් කරන්න.

(ලකුණු 20 යි.)